*[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]*

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

**මතුගම අධ්‍යාපන කලාපය**

# දෙවන වාර ඇගයීම - 2023

| 6 ශ්‍රේණිය | විෂයය - ගණිතය | පත්‍රය I/II | පැය – 2 යි. |
|---|---|---|---|

**නම** ..........................................................................................................................................

## I කොටස

**සැලකිය යුතුයි.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**


1) වෘත්තාකාර හැඩ යටින් ඉරක් අඳින්න.
i) බිත්තරය ii) වලල්ල iii) මුදුව iv) දොඩම් ගෙඩිය

2) 2002300500 සංඛ්‍යාව,
i) සම්මත ආකාරයට ලියන්න.
ii) කියවන ආකාරය වචනයෙන් ලියන්න.

3) පහත හිස් කොටු තුලට ගැලපෙන ලෙස < හෝ > ලකුණ යොදන්න.
i) $\frac{5}{12} \square \frac{5}{8}$ ii) $\frac{9}{20} \square \frac{7}{20}$


4) ළමයෙක් උතුරු දිශාවට 8m ක් ගොස් එතැන් සිට නැගෙනහිර දිශාවට 8m ගොස් නැවතුනේය. ඔහුට දැන් ආරම්භක ස්ථානය පෙනෙන්නේ කුමන දිශාවෙන්ද?

5) පහත නිරූපිත සංඛ්‍යා රටාවේ 3 වන හා 5 වන අවස්ථා ඇඳ දක්වන්න.




6) $\frac{2}{3} = \frac{6}{\square} = \frac{\square}{21}$ තුල්‍ය භාග ලැබෙන සේ හිස් කොටු පුරවන්න.

7) අඳුරු නොකළ කොටස භාගයක් ලෙස දක්වන්න.



8) 40 ත් 50 ත් අතර 7 ගුණාකාර ලියන්න.

9) දී ඇති රූපයේ දක්නට ලැබෙන කෝණ වර්ග දෙකක් ලියන්න.




a - .............................. b - ..............................

10) 18 සාධක සියල්ල ලියන්න.


11) නිමල් පළමු වාර පරීක්ෂණයේදී ගණිත විෂයය සඳහා ලබාගත් ලකුණු ආසන්න 10 ට වැටයූ විට 70 ක් විය. ඔහු ලබා ගත්තේ යැයි අපේක්ෂා කළ හැකි,

i) අඩුම ලකුණ කීයද?....................................

ii) වැඩිම ලකුණ කීයද?....................................

12) ලීටර 1.5 ක බීම බෝතලයකින් සිසුන් කීප දෙනෙක් බී ඉතිරි වූ බීම ප්‍රමාණය 285ml කි. සිසුන් බොන ලද බීම ප්‍රමාණය ලීටර සහ මිලි ලීටර වලින් දක්වන්න.

13) ඝනකයක් සෑදිය හැකි පතොරම තෝරා යටින් ඉරක් අඳින්න.




(i) (ii) (iii)

14) පහත ප්‍රකාශ හරි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( X ) ලකුණද යොදන්න.

a) 1 ප්‍රථමක සංඛ්‍යාවකි. ☐

b) සියලු සමචතුරස්‍ර සංඛ්‍යා සංයුක්ත සංඛ්‍යා වේ. ☐

15) පහත දී ඇති සංඛ්‍යා ඒවායේ ලක්ෂණ අනුව සමූහ 2 කට වෙන් කර ඇත. එම සමූහ වලට ගැළපෙන නම් දෙක හිස්තැන් මත ලියන්න.




.................................................... ....................................................

16) අවරෝහණ පිළිවෙලට ලියන්න.

0.3 , 0.35 , 1.3 , 0.03

17) පාද සියල්ල සමාන වූ චතුරස්‍ර වර්ග 2 ක් නම් කරන්න.

18) සරල රේඛීය සංවෘත තල රූප යටින් ඉරි අඳින්න.




(a) (b) (c) (d) (e) (f)


19) ගණකරාමුවේ දක්වා ඇති සංඛ්‍යාව,

i) ඉලක්කමෙන් ලියන්න.

ii) වචනයෙන් ලියන්න.




20) රූපයේ දී ඇති ත්‍රිකෝණයේ පරිමිතිය සොයන්න.



## II කොටස

**සැලකිය යුතුයි.**

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනිකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින්ද හිමිවේ.**

1) a) සංඛ්‍යා රටා පාඩම ඇසුරින් සිසුන් දෙදෙනෙක් විසින් ගොඩ නගන ලද සංඛ්‍යා රටා දෙකක් පහත දැක්වේ.

| සමිත | | කලණ | |
|---|---|---|---|
| 1 | = 1 | 1 | = 1 |
| 1+2 | = 3 | 1 + 3 | = 4 |
| 1+2+3 | = 6 | 1+3+5 | = 9 |
| 1+2+3+..... | = ....... | 1+3+5+..... | = ....... |

මෙම සංඛ්‍යා රටා දෙක පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන,

i) හිස්තැන් පුරවන්න. (ල.04)

ii) සමිත ගොඩ නගන රටාවෙන් නිරූපිත සංඛ්‍යා වර්ගය කුමක්ද? (ල.01)

iii) කලණ ගොඩ නගන රටාවෙන් නිරූපිත සංඛ්‍යා වර්ගය කුමක්ද? (ල.01)

iv) එහි අවසන් සංඛ්‍යාව තිත් රටාවකින් නිරූපණය කරන්න. (ල.02)

v) 1 සිට 25 දක්වා ඇති සමචතුරස්‍ර සංඛ්‍යා සියල්ල ලියන්න. (ල.02)

vi) ඉහත රටා දෙකෙහිම ලැබුණු සංඛ්‍යා අතරින් කුඩාම සංයුත සංඛ්‍යාව තෝරා ලියන්න. (ල.02)

b) 254☐

i) මෙම සංඛ්‍යාව 2න් ඉතිරි නැතිව බෙදේ නම් හිස් තැනට ගැළපෙන ඉලක්කම් සියල්ල ලියන්න. (ල.02)

ii) මෙම සංඛ්‍යාව 5න් ඉතිරි නැතිව බෙදේ නම් හිස් තැනට ගැළපෙන ඉලක්කම් සියල්ල ලියන්න. (ල.02)

2) i) 70.45 ගණකරාමුවක නිරූපණය කරන්න. (ල.02)

ii) පහත භාග දශම සංඛ්‍යා ලෙස ලියන්න.

$\frac{15}{10}$ = ................ $\frac{7}{100}$ = ................. (ල.02)

iii) <, >, = ලකුණ යොදා හිස්තැන් පුරවන්න.

a) 0.05 ................ 0.5

b) 0.7 ................. 0.70


c) 5.8 ................. 5.75 (ල.03)

iv) අගය සොයන්න.

a) 1.75 + 2.8 = ...................................... (ල.02)

b) 9.5 – 4.85 = ... .................................. (ල.02)

3) a) මෙහි දැක්වෙන පතොරමෙන් සෑදිය හැකි ඝන වස්තුවේ,



i) නම කුමක්ද?

ii) මුහුණත් ගණන කීයද?

iii) දාර ගණන කීයද?


iv) ශීර්ෂ ගණන කීයද? (ල.04)

b) 24357

i) 4 හි ස්ථානීය අගය කීයද? (ල.01)

ii) 4 න් නිරූපිත අගය 5 න් නිරූපිත් අගය මෙන් කී ගුණයක්ද? (ල.02)

c)




ඉහත රූප නිරීක්ෂණය කර රූපයේ නම ලියන්න. (ල.04)

| රූපය | නම |
|---|---|
| ① | ........................................ |
| ② | ........................................ |
| ③ | ........................................ |
| ④ | ........................................ |


4) a) පහත සඳහන් භාග ආරෝහණ පිළිවෙලට ලියන්න.

$\frac{3}{4}$ , $\frac{3}{9}$ , $\frac{3}{7}$ , $\frac{3}{20}$ (ල.02)

b) සුළු කරන්න.

i) $\frac{3}{9}+\frac{2}{9}$ (ල.01) ii) $\frac{3}{4}+\frac{2}{20}$ (ල.02) iii) $\frac{13}{15}-\frac{3}{5}$ (ල.02)

c) i) පහත සංඛ්‍යා රේඛාව මත -3 හා 2 ලක්ෂ්‍ය ලකුණු කරන්න. (ල.02)




ii) -3 හා +2 අතර පිහිටි සියළු සෘණ නිඛිල ආරෝහණ පටිපාටියට ලියන්න. (ල.02)


5) a) පිළිතුරු සපයන්න.

| (i) මිනිත්තු | තත්පර | (ල.02) | (ii) පැය | මිනිත්තු | (ල.02) |
|---|---|---|---|---|---|
| 20 | 42 | | 5 | 12 | |
| + 12 | 38 | | - 2 | 20 | |

b) හිස්තැන් පුරවන්න.

i) 4.7 cm = ............mm ii) ..............m = 1520 cm iii) 5 km 20 m= ..............Km (ල.03)

c) A හා B භාජන දෙකකට පුරවා ඇති ජල ප්‍රමාණ රූපයේ දැක්වේ.




i) A භාජනයේ ඇති ජල ප්‍රමාණය ml කොපමණද? (ල.01)

ii) B භාජනයේ ඇති ජල ප්‍රමාණය ලීටර වලින් දක්වන්න. (ල.01)

iii) A භාජනයේ ඇති ජල ප්‍රමාණය B භාජනයේ ඇති ජල ප්‍රමාණයට වඩා කොපමණ වැඩිද? (ල.02)

6) a) A හා B යනු පාසල් දෙකකි. A පාසලේ සිසුන් 1007 ක් ද B පාසලේ සිසුන් 695 ක් ද ඉගෙනුම ලබති.


i) A හා B පාසල් දෙකේ සිටින මුළු සිසුන් ගණන කීයද? (ල.02)

ii) B පාසලට වඩා A පාසලේ වැඩියෙන් සිටින සිසුන් ගණන කීයද? (ල.02)


iii) A පාසලේ 6 ශ්‍රේණියේ ළමුන් 25 ක් සිටිති. එක් ළමයෙකුට අභ්‍යාස පොත් 15 ක් බැගින් බෙදා දෙන ලදී. බෙදා දුන් මුළු අභ්‍යාස පොත් ගණන කීයද? (ල.03)

b) පහත රූප සටහනේ දැක්වෙන කෝණ වර්ග නම් කරන්න. (ල.04)

a =
b =
c =
d =




7) a) සමතලා බිමක කුඹියෙකු ගමන් ගත් ආකාරය කොටු ජාලයේ දැක්වේ.




| ගමන් මග | ගමන් කළ දිශාව |
|---|---|
| A සිට B දක්වා | ඊසාන |
| B සිට C දක්වා | ............................. |
| C සිට D දක්වා | ............................. |
| D සිට A දක්වා | ............................. |

(ල.03)

b) i) පොදු ලක්ෂණයක් අනුව කාණ්ඩ දෙකකට වෙන් කරන්න. (ල.04)

ii) එම කාණ්ඩ සඳහා සුදුසු නම් එක එකක් යටින් තිත් ඉර මත ලියන්න. (ල.02)

**සමචතුරස්‍රය,ඝනකය,ත්‍රැපීසියම,සිලින්ඩරය , චතුස්තලය,ත්‍රිකෝණය,ඝනකභය,ඍජුකෝණාස්‍රය**

----------------- -----------------


c) හිස්තැනට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

i) තලයක තිරස් බව දන ගැනීමට ........................................ නම් උපකරණය භාවිතා කරයි.

ii) සිරස් පිහිටීම හඳුනා ගැනීමට ...................................... නම් උපකරණය භාවිතා කරයි. (ල.02)

# පිළිතුරු පත්‍රය - 6 ශ්‍රේණිය

## I කොටස

1) ii , iii - එකකට (1) බැගින් - [ල.02]
2) (i) සම්මත ආකාරයෙන් ලිවීමට - [ල.01]
   (ii) වචනයෙන් ලිවීමට - [ල.01]
3) (i) < - [ල.01] (ii) > - [ල.01]
4) 

 - [ල.01] නිරිත් දිශාව - [ල.01]
5) නිවැරදි රූපයට ලකුණු (1) බැගින් - [ල.02]
6) $\frac{6}{\boxed{9}} = \frac{\boxed{14}}{21}$ ලකුණු (1) බැගින් - [ල.02]
7) $\frac{13}{16}$ - [ල.02]
8) 42 , 49 - [ල.02]
9) නිවැරදි කෝණයට ලකුණු (1) බැගින් - [ල.02]
10) 1 , 2 , 3 , 6 , 9 , 18 සාධක 4 – [ල.01]
    ඊට වැඩි - [ල.02]
11) (i) 65 - [ල.02]
    (ii) 74 - [ල.02]
12)

| l | ml |
|---|---|
| 1 | 500 |
| - | 285 |
| 1 | 215 |

 - [ල.02]

13) (iii) - [ල.02]
14) (a) x - [ල.01]
    (b) x - [ල.01]
15) නිවැරදි ලක්ෂණයට ලකුණු (1) බැගින් - [ල.02]
16) 1.3 , 0.35 , 0.3 , 0.03 – [ල.02]
17) සමචතුරස්‍රය , රෝම්බසය (1) බැගින් - [ල.02]
18) (b) , (e) - [ල.02]
19) (i) 124.3 - [ල.01] (ii) වචනයෙන් ලිවීමට - [ල.01]
20)

| m | cm | |
|---|---|---|
| 12 | 00 | |
| 15 | 76 | [ල.01] |
| + 22 | 34 | |
| 50 | 10 | [ල.01] |

## II කොටස

1) (a) (i)

| සමිත | | කලණ | |
|---|---|---|---|
| 4 → 10 | - [ල.02] | 7 → 16 | - [ල.02] |

(ii) ත්‍රිකෝණ සංඛ්‍යා - [ල.01]
(iii) සමචතුරස්‍ර සංඛ්‍යා - [ල.01]
(iv) තිත් රටාවකින් නිරූපණයට - [ල.02]
(v) 1 , 4 , 9 , 16 - [ල.02]
(vi) 4 - [ල.02]

(b) (i) 0 , 2 , 4 , 6 , 8 - [ල.02] (ඉලක්කම් 3 හෝ 4 - [ල.01])

(ii) 0 , 5 - [ල.02] (එකකට 1 බැගින් )

2) (i) නිවැරදි නිරූපණයට - [ල.02]
(ii) 1.5 – [ල.01] 0.07 - [ල.01]
(iii) (a) < - [ල.01]
(b) = - [ල.01]
(c) > - [ල.01]
(iv) (a) 4.55 - [ල.02]

(b) 4.65 - [ල.02]

3) (a) (i) චතුස්තලය - [ල.01]
(ii) 4 - [ල.01]
(iii) 6 - [ල.01]
(iv) 4 - [ල.01]
(b) (i) 1000 - [ල.01]
(ii) $\frac{4000}{50}$ = 80 - [ල.01]
[ල.01]
(c) නිවැරදි රූපයට - [ල.04]

4) (a) $\frac{3}{20}, \frac{3}{9}, \frac{3}{7}, \frac{3}{4}$ - [ල.02]

(b) (i) $\frac{5}{9}$ - [ල.01]
(ii) $\frac{3 \times 5}{4 \times 5} + \frac{2}{20} = \frac{17}{20}$ - [ල.01]
[ල.01]
(iii) $\frac{13}{15} - \frac{3 \times 3}{5 \times 3} = \frac{4}{15}$ - [ල.01]
[ල.01]
(c) (i) නිවැරදි නිරූපණයට - 01 x 2 – [ල.02]
(ii) -2 , -1 - [ල.02]

5) (a) (i) මී. 33 තත්: 20 - [ල.02] (ii) පැ. 2 මි. 52 - [ල.02]
(b) (i) 47mm - [ල.01] (ii) 15.2m - [ල.01] (iii) 5.02 km - [ල.01]
(c) (i) 2500ml - [ල.01] (ii) 0.45 l - [ල.01] (iii) 2 l 50 ml හෝ 2050 ml - [ල.02]

6) (*a*) (i) 1007 + 695 = 1702
[ල.01] [ල.01]
(ii) 1007 – 695 = 312
[ල.01] [ල.01]
(iii) 25 x
15 — [ල.01]
125
250 — [ල.01]
375 — [ල.01]

(b) නිවැරදි කෝණයට - ලකුණු (1) බැගින් - [ල.04]

7) (a) ගිනිකොණ , නිරිත , වයඹ - [ල.03]
(b) (i) නිවැරදි කාණ්ඩ වලට වෙන් කිරීමට ල.2 x 2 - [ල.04]
(ii) නිවැරදිව නම් කිරීමට - [ල.02]
(c) (i) ස්ප්‍රිතු ලෙවලය - [ල.01]
(ii) ලඹය - [ල.01]


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න